සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

02 ශ්‍රේණිය - බුද්ධ ධර්මය -අගෝස්තු 04 සතිය

සැකසුම - බලංගොඩ අධ්‍යාපන කලාපය

කේ.සී.එස්.උදයකාන්ති ( ර / විද්‍යාකර ප්‍රාථමික විද්‍යාලය)

- පුංචි දුවේ පුතේ දිනපතා ඔබ බුද්ධ වන්දනාව කරනවා නේද ?
- බුද්ධ වන්දනාවෙන් පසුව මෛත්‍රී භාවනාවත් කරනවා නේද ?
- මම හිතනවා ඔයාලා සියලුම දෙනා මේ දේවල් කරනවා ඇති කියලා .......

❖ **එහෙනම් බුද්ධ වන්දනාවෙන් හා භාවනා කිරීමෙන් පසු පහතින් මම අහන ප්‍රශ්නවලට පිළිතුරු දෙන්නකෝ...**

(01) මගෙන් අද සතුන්ට හිංසාවක් වුණා ද?

(02) අන් සතු දෙයක් නොකියාම ලබා ගත්තාද ?

(03) මම අද බොරු කීවාද ?

(04) මම අද පරුෂ වචන කීවාද ?

❖ **දරුවනේ අපි පන්සලට ගිය විට සිල් ගත්තු විට පහතින් දැක්වෙන වචන කියන්නේ මෙහෙමයි .ඒවාට කියන්නේ ශාසනික වචන කියලා**

ආහාර - දානය

වතුර - පැන්

කනවා - වළඳනවා

බුලත් විට - දැහැත්

යනවා - වඩිනවා

අතු ගානවා - අමදිනවා

සෝදනවා - ධෝවනය කරනවා

❖ **එහෙනම් දරුවනේ පහත වචන නිවැරදිව ගළපා යා කරන්න**

| | |
|---|---|
| ආහාර | වළඳනවා |
| කනවා | දැහැත් |
| වතුර | අමදිනවා |
| බුලත් විට | ධෝවනය කරනවා |
| සෝදනවා | වඩිනවා |
| අතු ගානවා | දානය |
| යනවා | පැන් |